# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රාසංගික කලාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය - 2018/2019

## සංගීත පීඨය

**<u>සංගීතයෙහි අධ්‍යාපනික හා මනෝවිද්‍යාත්මක පදනම සහ ඉගැන්වීමේ ක්‍රමවේදය</u>**

**<u>MUEM 31162 (E)</u>**

කාලය :- පැ 02

සැ.යු :- පිළිතුරු ලිවීම ආරම්භ කිරීමට පෙර දී ඇති උපදෙස් හොඳින් කියවන්න.

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සමන්විත වේ.
- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- ❖ සෑම ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කරන්න.
- ❖ සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ලැබේ.

---

1. i. "මනෝවිද්‍යාව" යන්න, නිර්වචන ආශ්‍රයෙන් පැහැදිලි කොට මනෝවිද්‍යාව විෂය හැදෑරීමේ ප්‍රයෝජන පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 10)

ii. අධ්‍යාපන මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රය හඳුන්වා එහි ප්‍රයෝජන උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 15)

2. සංගීතයෙහි අධ්‍යාපනික වටිනාකම මනෝවිද්‍යා දෘෂ්ටිකෝණයෙන් විමසන්න.

(ලකුණු 25)

3. සංගීතයෙහි මනෝවිද්‍යාත්මක පදනම පිළිබඳව සැකෙවින් විස්තර කොට, එය පුද්ගල චර්යාව කෙරෙහි බලපාන අයුරු උදාහරණ ඇසුරින් විග්‍රහ කරන්න.

(ලකුණු 25)

4. සංගීතයෙහි ඇති මනෝවිද්‍යා ප්‍රතිකාරාත්මක වටිනාකම හේතුවෙන් වර්තමානය වන විට එය ලොව පුරා භාවිතයට පත්ව ඇත. ඒ ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සංගීතය මනෝවිද්‍යා ප්‍රතිකාර ක්‍රමයක් ලෙස භාවිතයට පත්වීම හා එහි ව්‍යාප්තිය පිළිබඳව විශේෂ සන්ධිස්ථාන ඔස්සේ සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 10)

ii. සංගීත චිකිත්සාව යන්න සරලව පැහැදිලි කර, එයින් ලැබෙන ප්‍රයෝජන උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

5. සංගීත විෂයෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගත හැකි සුවිශේෂී ඉගැන්වීම් ක්‍රමවේද **අටක්** නම් කර, එම ඉගැන්වීම් ක්‍රමවේද අතරින් **හතරක්** සංගීත විෂයය ඉගැන්වීමේ දී යොදා ගත හැකි ආකාරය උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 25)

6. සංගීත විෂයය හැදෑරීමෙන් පුද්ගල ආවේදන ක්ෂේත්‍රය පෝෂණය වන අයුරු ඔබේ අදහස් ඇසුරෙන් විමසන්න.

(ලකුණු 25)

::::::::::::::::::::::::::::::::

**2021.11.15**